ඇඹිලිපිටිය කලාපය

සිංහල භාෂාව හා සාහිත්‍යය.

දෙවන වාරයට අදාළ පාඩම් මාලාව-2020 - 8 ශ්‍රේණිය

09. අවුරුදු සිහිනය - පළමු පාඩම

- අප ජීවත්වන සමාජයේ අප ඇතුළු සියළු මිනිසුන්ට විඳින්නට අසන්නට දකින්නට ලැබෙන සිදුවීම් රාශියකි. දුක,සතුට සේම මධ්‍යස්ථව ඉවසිය හැකි අත්දැකීම් වලට ද අප මුහුණ දේ.
- මෙම සිදුවීම් එකිනෙකාට සමාන හෝ අසමාන විය හැක. ඒවා අදාළ කරගෙන විවිධාකාර නිර්මාණ බිහි කළ හැකිය.
- නවකතා,කෙටිකතා,ගී පද රචනා,පද්‍ය පන්ති,නාට්‍ය,චිත්‍ර,පෝස්ටර් ඒ සඳහා යොදාගත හැකි සාහිත්‍ය මාධ්‍ය වේ.
- මේවා මගින් සමාජයට ලැබෙන දැනුම මෙන්ම සාහිත්‍ය රසවින්දනය ඉතා විශාලය.
- දිළිඳුබව,ආහාර හිඟකම,මිනිසුන් සතු විවිධ ගතිගුණ,බලාපොරොත්තු ,සිතේ ඇතිවන විවිධ සිතුවිලි පිළිබඳ නිර්මාණයක් මගින් ඉදිරිපත් වේ.
- කෙටිකතාවකින් එවැනි ප්‍රබල සමාජ සිද්ධීන් ඉතා රසවත්ව හදවතට දැනෙන ආකාරයෙන් ඉදිරිපත් කළ හැක.
- මෙවැනි විශිෂ්ට නිර්මාණ බිහිකළ නිර්මාණකරුවන් අතර සමාජය පිළිබඳ කතා කළ ප්‍රබල කෙටිකතා රචකයෙක් වශයෙන් ගුණදාස අමරසේකර මහතා ඉදිරියෙන්ම සිටී.
- එතුමාගේ නිර්මාණ බොහොමයක් අතර "රතු රෝසමල" කෙටිකතා සංග්‍රහය තුළ අපට හමුවන "අවුරුදු සිහිනය" කෙටිකතාව ඔබ වැනි දරුවකුගේ අහිංසක බලාපොරොත්තුවක් පිළිබඳ කියැවේ.
- දිළිඳුකම හේතුවෙන් ධනවත් නිවෙසක මෙහෙකාර සේවයට යෙදවෙන,පියා අහිමිව සිටින 'පියසේන' නම් දරුවා සිංහල හින්දු අලුත් අවුරුද්දට තම නිවසට කැඳවාගෙන යාමසඳහා තමාගේ මව එනු ඇතැයි අපේක්ෂා සහගතව බලා සිටිනා අකාරය මේ කෙටිකතාවෙන් විස්තර කෙරේ.
- මව පියා අහිමි වීමෙන් අනන්ත අප්‍රමාණ දුක් සෝ තැවුල් ඉවසන දරුවන් බොහෝය.
- එවන් දරුවෙකු වූ පියසේන යනු ඔබ සේ ම අධ්‍යාපනය හැදෑරිය යුතු පාසල් යා යුතු දරුවෙක් වුවද ඔහුට ඒ අයිතිවාසිකම් ලැබී නැත.

පැවරුම

1. අවුරුදු සිහිනය පාඩම හොඳින් කියවන්න.
2. කතාවේ ප්‍රධාන සිදුවීම් මතකයෙන් අනුපිළිවෙළින් ලියාදක්වන්න.
3. ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.